# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2359/05 - 2023 නොවැම්බර් මස 20 වැනි සඳුදා - 2023.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 94/47 (viii)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "පොතුවටවන මහා විහාරය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ "පොතුවටවන මහා විහාරය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 නොවැම්බර් මස 16 වැනි දින කොළඹ දී ය.

උපලේඛනය

**පොතුවටවන මහා විහාරය සංයුක්ත වන ප්‍රදේශය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 464 පොතුවටවන ගමෙහි පිහිටි හෙක්ටයාර් 1.1798 ක් විශාලත්වයෙන් යුතු සර්වේයර් ජනරාල්ගේ 2023 ජූලි මස 27 දිනැති අංක PU/DNK/2023/314 දරන අනුරේඛනයේ කැබලි අක්ෂර "A" පන්සල යාය කැලේ වශයෙන් නිරූපිත පහත පරිදි මායිම් වූ ප්‍රදේශය -


1A - G 40791 — 11 (2023/11)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කැබලි අක්ෂරඃ A - පන්සල යාය කැලේ

*උතුරට* : පාර, එස්. ඒ. සීතා කුමුදුනී හිමිකම් කියන තල්ගහවත්ත සහ පාර

*නැගෙනහිරට* : එස්. ඒ. සීතා කුමුදුනී හිමිකම් කියන තල්ගහවත්ත සහ පාර

*දකුණට* : පාර, ප්‍රාදේශීය සභා මාර්ගය පාර සහ ප්‍රාදේශීය සභා මාර්ගය

*බටහිරට* : ප්‍රාදේශීය සභා මාර්ගය සහ පාර

EOG 11 - 0204

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.